Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
www.sannasa.com
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

සංස්කරණය / Editor
අසෝක සුබසිංහ
Asoka Subasinghe

සංස්කරණ උපදේශක / Editorial Advisor
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

සහය සංස්කාරක / Asst. Editor
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

ක්‍රීඩා සංස්කාරක / Sports Editor
අසෝක සිල්වා Asoka Silva

රූ රචා / Graphics
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

වෙළඳ දැන්වීම් / Advertising
03 8707 4604
0402 025 516
email ads.sannasa@gmail.com

Account Details for Payments

Bank - ANZ
Branch - 013312
A/C number - 254306608
Name of A/C
Sannasa News Group

සන්නස පිරිවර
සිසිර දිසානායක
වී ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

ඡායා රූ / Photography
Prasanna Kurukularatna

සම්බන්ධීකරණය

NSW
Lakshman Kodituwakku

WA
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

QLD
Ananada Samaratunga
7, Stuart Place
Forest Lake
QLD 4078
(07) 3372 7958

ACT
Asoka Nimalasiri
0400 429 031

SA
Chandra Eeriyagama
08 8331 2318

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

රජය වගකීම

රටක් වශයෙන් අප මුහුණ පා ඇති පරිහානියේ තරම කොපමණද යන්න අවබෝධ කර ගැනීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ පසුගිය වසර දෙකෙහි පැමිණිලි වාර්තා දෙස බැලීම පමණක් ම සෑහේ යයි අපට සිතේ. 2010 වසරට ළමා අපයෝජන සම්බන්ධයෙන් පැමිණිලි 1029 කි. මේ වසරේ මුල් කාර්තුවේ පමණක් පැමිණිලි 364 කි. මේ සංඛ්‍යා වාර්තා වන සිද්ධි සඳහා පමණකි. නොයෙකුත් බාහිර බලපෑම් නිසා වාර්තා නොවන සිද්ධි ද මීට සමානව ඇතැයි අනුමාන කළ හැකි ය. විවිධ ළමා අපයෝජන අතරින් ලිංගික අපයෝජනය ප්‍රධාන තැනක් ගෙන තිබේ. කණගාටුවට කරුණ වන්නේ ලිංගික හිංසනයට බොහෝ විට ගොදුරු වී ඇත්තේ තමන් දන්නා හඳුනන සමීප පුද්ගලයන් අතින් වීම යි.

මෑත කාලීනව කුඩා දරුවන් ලිංගික අපයෝජනයට ලක් කිරීම රැල්ලක් මෙන් වේගයෙන් සමාජය පුරා පැතිර යමින් ගිහි සමාජය පසු කරමින් පැවිද්දන් දක්වා ගොස් තිබීම සමාජය මහත් කම්පාවට පත් කර තිබේ. මේ සම්බන්ධයෙන් වගකිවයුත්තේ කවුරුන්ද හා මේ අපරාධ රැල්ල වළක්වා ගන්නේ කෙසේ ද යන්න උහතෝකෝටිකයක් වන ලකුණු පහළ වෙමින් තිබීම ජාතියේම අවාසනාවකි. මන්ද බොහෝ විට මේ චෝදනා-වන්ට ලක් වන්නන්ට විවිධ බාහිර හා දේශපාලන බලපෑම් හරහා නීතියේ රැහැතින් මිදී පලා යාමට අවකාශ සැළසී තිබීමයි.

රටක ගොඩනැගිලි මං මාවත් විශාල ව්‍යාපෘති ඉදිවීම නවෝදයක ලකුණු බව සැබෑ ය. එහෙත් රටක් වශයෙන් ඉදිරියට යාමට නම් නීතිය හා සාමයත් සදාචාරයත් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී හිඳහසත් ඒ හා සමානව ඉදිරියට යා යුතු ය.

ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ප්‍රධාන වගකීම විය යුත්තේ තම රටේ ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමයි. රටෙහි ළමා පරපුර ඉන් විශේෂිත කොටස බව අවිවාදිත ය. රජයක් ඒ වගකීම ඉටුකිරීමට අසමත් වන්නේ නම් ඒ රටේ නීතිය හා සාමය බිඳ වැටීම වළක්වා ගත නොහැකි ය. රටේ ජනතාවට නීතිය තම අතට ගෙන කටයුතු කිරීමට සිදුවන්නේ එවිට ය. පසුගිය කාලය පුරාම අපි එය අත්විඳ ඇත්තෙමු.

අපට වැටහෙන පරිද්දෙන් නම් මේ ප්‍රශ්නය විසඳීම ඉරණමට දෙවියනට හෝ ආගමික සංස්ථාවකට භාර කළ හැකි කාලය පසුවී ගොස් ය. නොපමාව කළ යුත්තේ වල් වැදී ඇති රටේ නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කොට අධිකරණයේ ස්වාධීනත්වට ඉඩ සැළසීම යි.

රට යන අත

මහින්ද රාජපක්ෂ තෙම්පරාදු වූ දේශපාලකයෙකැයි හැඳින්වෙයි. එය ඇත්තක් විය හැකි ය. එහෙත් ඒ තෙම්පරාදු වූ දේශපාලකයා රට පාලනය කරන්නේ නම් තෙම්පරාදු වූ පාලකයකු ලෙස නොවේ. අඳුරේ අතපත ගාමින් යන අන්ධයකු සේ ය.

ශ්‍රී ලංකා ඉතිහාසයේ සදාකාලික වන්දනාවට පාත්‍රවන රාජ්‍ය නායකයා ලෙස ඉතිහාසගතවීමට තිබූ ඉඩ කඩ මහින්ද රාජපක්ෂ විසින්ම විනාශ කරගනු ලබමින් සිටින ආකාරය අතිශය කනගාටුදායක ය. යුද්ධය නිමා කිරීමෙන් පසු ඒ දක්වා රට වෙළාගෙන සිටි සකළවිධ ව්‍යාධීන් අකා මකා දමා නව ශ්‍රී ලංකාවක් ගොඩ නගන්නට ඔහුට තිබූ මාහැඟි අවස්ථාව ඔහු විනාශ කරගත්තේ උද්ධච්ඡ කම නිසා ද නොදැනුවත් කම නිසා ද යන්න දන්නේ දෙවියන් පමණකි.

යුද්ධය නිමා කළා සේම සමස්ථ දේශය වෙළා ගත් දූෂණය නිමා කර රටට සාපයක් වූ මනාප ජන්ද ක්‍රමය නමැති සර්පයා මරා දමා ආදර්ශවත් රටක් ගොඩ නගන්නට ඔහුට ස්වර්ණමය අවකාශයක් උදා වී තිබුණි. ඔහු ඒ අවකාශය නොදැටුවේ ය. ඒ ස්වර්ණමය මොහොත ගෙවී යන තෙක් විවිධාකර විප්‍රකාර කරමින් කල් මැරූ මහින්ද දැන් ජාතියේ ශාපයක් බවට පත්වෙමින් සිටින ආකාරය ඇස් කන් ඇති ඕනෑම මෝඩයකුට දැක බලා ගත හැකි ය. මෙතරම් නීතිය වල් වැදුණ අධිකරණය දේශපාකයන්ගේ පාමුළ දණ ගැස්සවූ මෙවන් යුගයක් ශ්‍රී ලංකා ඉතිහාසයේ කවරදාකවත් නොවී ය. නීතියේ ආධිපත්‍යය බිඳ වැටුණ තැන බිහිවන්නේ ස්වර්ගය නොවේ. නරකාදියයි.

ආදර්ශමත් රාජ්‍ය පාලකයකු ලෙස ජනතාව ඉදිරියේ අභිමානයෙන් නැගී සිටිනු වෙනුවට දූෂණය හීෂණය පතුරුවන එසේත් නැත්නම් ඒවා නිහඬව අනුමත කරන වැදි බණ දෙසන පවුල්වාදය පතුරුවන රාජ්‍යපාලකයකු බවට පත්වීම මහින්ද තෝරාගත්තේ මන්දැයි අනාගතය මහජනතාවට තේරුම් කරදෙනු ඇත.

සංස්කාරක

නිහඬ බුද්ධිමතුන් සමාජ අරගලයකට කැඳවන සරසවි ඇදුරු සටන

හිනිදුම සුනිල් සෙනෙවි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සබරගමුව විශ්වවිද්‍යාලය.

ප්‍රවේශය

පශ්චාත් යටත් විජිත ශ්‍රී ලංකාවේ රාජ්‍ය අධ්‍යාපනය රැක ගැනීමේ පමාවී දැල්වෙන පහනක් සරසවි ඇදුරු සටන ලෙස මේ දිනවල උණුසුම්ව දැල්වේ. එය ඉතාම සවිදාහනික ව කල් දැමූ අමතක කළ නොසලකා හැරි අරගලයක සාර්ථක ප්‍රථම පියවරය. වැදුපුට ඔබ්බෙන් පුළුල් විය යුතු අප ප්‍රාර්ථනා කළ ව්‍යාජ්ත සටන් පාඨ සහිතව මෙවර තැබූ පියවර පිළිබඳව මේ වන විට ලිපි රැසක් ලියැවී තිබුණ ද විමසනය පිණිස ඉතිරි වූ ක්ෂේත්‍ර බොහොමයකි. අතහැර දැමූ නිසා ම වල් වැදුණු තේමා රැසක් ප්‍රතිබැහැර දැකීමට අප අබිමුව ශේෂ වී ඇතත් මෙම කෙටි විවරණිකාවෙන් ද අපේක්ෂා කරන්නේ එක් එක් කරුණු ගැඹුරට විනිවිදීමට වඩා අර්බුදය ඔඩුදුවා ඇති අඩවි තේමාවක්ව හඳුනා ගැනීමට ය.

අවසානයේ කෙසේ හෝ දුෂ්කරම පියවර තැබූ බැවින් පියවර දහසක හිඳහස් අධ්‍යාපනයේ * රාජ්‍ය අධ්‍යාපනයේ සුරක්ෂිතතාව පතන චාරිකාව යා යුතුය. නිහඬ බුද්ධිමතුන් සමාජ ව්‍යාපාරයක ප්‍රබුද්ධ කරවූ මේ පහන් දැල්ල ලංකාව වසා ඇති අඳුරක් පලවා හරින පහන් වැටක් තෙක් දිගේලි විය යුතුය. ඒ සඳහා අඳුර හඳුනා ගැනීම සහ ආලෝකය පිළිබඳ විශ්වාසය තැබීම අපේ වගකීම් සහගත මේ මොහොත වී ඇත.

අඳුරෙහි භූමිකාව

ප්‍රදීපයට තරම් බලයක් * දෘෂ්ටියක් අඳුරට ද තිබීම සහ එය ශ්‍රී ලාංකික ජීවන සූත්‍රය වීමට තරම් ලයහපත් බවේ සාපයල ජනමූල නායකත්වය විසින් පාරිභෝජන මූල ජීවනාශාවක් අප රට තුළ වපුරා ඇත. තමන් කැමැත්තෙන් තෝරාගත් යථාර්ථයක් නිසා දිනපතා දුක් විඳින අපූරු සත්ව කොට්ඨාසයක් මිහිමත සිටින් නම් ඒ ලලංකා ජනතාවල විය යුතුය. දිගුකලක් අඳුරම රජයන කල ඉරක් පිළිබඳ දෙඩූ එකාගේ ගෙළ අඳුරේම මිරිකන සූත්‍රයක් ලංකාවේ ඇති බව ආර්යවංශ රණවීර කිවිඳු ලිවීය. එය සත්‍ය ය. කප්පරක් දොරමඩලා, අපේ ගම ආදි විද්‍යුත් මාධ්‍ය උගුල්වල බුද්ධිමය ශ්‍රමය ලවිද්වතුන්ගෙනිල. රූපවාහිනි රියැලිටි බණ දෙසන්නේ සසර බිය නොදකින පිරිසකි. දළදා මාළිගාවේ එළිපත්ත මතින් ලැම්බො ගිනි රථ රෙස් යයි. උසාවි සිරමැදිරියේ සිටින පුතාට ගංජා ගෙනෙන්නේ අම්මාය. රාජ්‍ය සමාගම් 93 ක් විගණනයට බලය නැති විගණකාධිපතිවරයෙක් ලක්දිව ඇත. (රාවය* 2012/1/29) භෞද සාක්ෂිය මහින්ද චින්තනයට පාවා දුන් රාජ්‍ය නිලධාරීන් මෙහි සුළබ බව ජේ. සී. වැලිඇමුණ ලියයි. (එම) ලිංගික අපචාර, ළමා අපචාර දින දින ඉහළ යයි. නීතිය ඉදිරියට කිසි දා ගෙන ආ නොහැකි ඝාතන සංස්කෘතියක් මුල් අල්ලා ඇත. ජුලම්පිටියෙ අමරෙ මැතිවරණයකින් ජය ලැබීමට අවකාශ ඇති බව ඩෙස්මන්ඩ් මල්ලිකාරච්චි සඳහන් කරයි. සියලු රජයේ පාසල්වල විවිධ පනත් හා සංකල්ප වලින් ආවරණය වී මුදල් අය කරන අධ්‍යාපනයක් අනියමින් ගෙන යයි. විභාග සමත් වී මේ නරා

4 වන පිටට